# උපදෙස් පත්‍රිකාව

**අයදුම්කරුවන් සඳහා උපදෙස්**

මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් සිදු කරන බැවින් ඒ සඳහා පහත සඳහන් පියවර අනුගමනය කරනු මැනවි.

**පියවර 01**

අයදුම්පත් ගාස්තු ගෙවීම

- ඔබ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන් ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු වශයෙන් **රුපියල් 1000/=** ක් ගෙවීම අනිවාර්ය වේ. (මහජන බැංකුව - ගංගොඩවිල ශාඛාවට බැර වන පරිදි ඕනෑම මහජන බැංකුව ශාඛාවකින් මෙම මුදල් තැන්පත් කිරීම සිදු කළ හැකිය. )

| පාඨමාලාව | ගිණුම් අංකය |
|---|---|
| අපරාධවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (Intake 14) | 013010001322 |

- මුදල් තැන්පතු රිසිට් පතේ පාඨමාලාවට අයදුම්කරන්නාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකතන අංකය ඇතුලත් කිරීම අනිවාර්යය වේ.
- බැංකු රිසිට් පතෙහි ඡායාපිටපතක් ඔබ ළඟ තබාගත යුතුය.
- ඔබ විසින් ගෙවන ලද අයදුම්පත් ගාස්තුව කිසිම හේතුවක් මත නැවත නොගෙවන බව ද දන්වා සිටිමු.

පාඨමාලා ගාස්තු ඔබට වාරික දෙකකින් ගෙවිය හැකිය. **පළමු වාරිකය (රුපියල් 40,000 ක්) පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතු අතර දෙවන වාරිකය (රුපියල් 35,000 ක්) පාඨමාලාව ආරම්භ වී මාස 3ක් ඇතුළත ගෙවිය යුතුය. (පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා එක් එක් සිසුන්ට අනන්‍ය වූ බැංකු ගිණුම් අංක පවතින අතර අදාල ගිණුම් අංක පාඨමාලාව සඳහා තේරීපත් වූ පසු ඔබට ලබා දෙනු ඇත)**

**පියවර 02**

ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු ගෙවීමෙන් අනතුරුව පහත **ලින්ක්** එකට පිවිස පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ අයදුම් පත්‍රය සම්පූර්ණ කරන්න.

https://docs.google.com/forms/d/e/1FAIpQLSeugivDSGAgoL7ceLQeaX-NwR6Ww3_XXKADkPn_bsZaCZZ_NBZUQ/_viewform?usp=sf_link

Diploma in Criminology

**පියවර 03**

ලබාදී ඇති අයදුම්පත්‍රය අයදුම්කරුට එක් වරක් පමණක් පිරවිය හැකි බැවින් එය ඉතාමත් සැලකිලිමත්ව පිරවීමට වගබලා ගන්න. ඔබගේ නිවැරදි තොරතුරු පමණක් ලබා දී ඇති ගූගල් පෝරමයේ නිවැරදි ස්ථානයේ නියමිත පරිදි පුරවන්න.

එසේම ඔබගේ පෞද්ගලික ලිපිගොනුව තුළ අඩංගු විය යුතු පහත සඳහන් ලේඛනවල මුල් පිටපත් වල (Original certificates) පී.ඩී.එෆ් (PDF) පමණක් උඩුගත (Upload) කළ යුතුය.(පහත ලිපිගොනු උඩුගත කිරීමට ප්‍රථමයෙන් එම පී.ඩී.එෆ් (PDF) ලිපිගොනු ඔබගේ නමින් (Rename) කිරීම සිදුකළ යුතු ය.

i. ජාතික හැඳුනුම්පත් පිටපත **(මුලකුරු සමඟ නම 01 – M.L.Perera -01)**
ii. අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සහතික පිටපත් **(මුලකුරු සමඟ නම 02 - M.L.Perera -02)**
iii. වෙනත් අධ්‍යාපන සුදුසුකම් සහතික පිටපත්
iv. සේවා සහතිකය
v. මුදල් ගෙවන ලද රිසිට් පතෙහි පිටපත

**පියවර 04**

අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ විද්‍යුත් තැපැල වෙත අප විසින් එවන ලද ඔබගේ අයදුම්පත්‍රයේ පිටපත භාගත (download) කර ගැනීම කළ යුතුය.

**පියවර 05**

එසේ භාගත කරගත් අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැල හරහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ උඩුගත කරන ලද මුල් සහතිකපත්හි සත්‍ය පිටපත් **(True Copy)** බවට සහතික කරන ලද පිටපත් සමඟ අමුණා පහත ලිපිනයට 2024/04/30 දින හෝ එදිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**පාඨමාලා සමායෝජක,**

**අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය,**

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**

**ගංගොඩවිල,**

**නුගේගොඩ.**

Diploma in Criminology

සැ.යු. - ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර " අපරාධවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025" ලෙස සඳහන් කළ යුතුය.

## <u>පොදු උපදෙස්</u>

- මෙම <u>උපදෙස් මාලාවට අනුකූල නොවන ලෙස එවන අයදුම්පත්‍ර හා 2024/04/30 පසු ලැබෙන අයදුම්පත්‍ර කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.</u>
- ඔබගේ අයදුම්පත්‍රය අනුව අදාළ පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණයට ඔබව තෝරා ගනු ලැබුවහොත් ඒ බව පෞද්ගලිකව දන්වනු ලබන අතර පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ ඒ අනුවය.
- පාඨමාලා ගාස්තු තම සේවායෝජකයා මඟින් ගෙවීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් තම අයදුම්පත් තම සේවා යෝජකයා මඟින් එවීම ප්‍රයෝජනවත් විය හැකිය.

*************************************************************************

Diploma in Criminology